
Digital Magazine

01st Issue | 2024 march 31

Digital ලෝකයේ Modern කියවන්නිය



# කියන්නෝ නො අසන අසන්නාගේ කියවීම



**"මතු මා පැතූ කිසිවක් නොවේ සැනසීම වේ ආදරේ...."**

මා "කිරිකෝඩු හිතට" ඇසූ පළමු වර මෙය නොවේ. නමුත් උක්ත පැදි පෙළ මා යටි සිතෙහි තැන්පත් වූ පළමු වර මෙය යි. ඉන් සිතුවිලි දමක පැටලී සිටි මම නැවත නැවතත් සිතන්නට වීමි. සැබවින් ම අපි, සැනසීමෙන් ආදරය අත්විඳින්නටත්, ආදරය තුළ සැනසීමක් සොයන්නටත් වෙහෙසෙන්නෝ නොවෙමු ද? ජීවිතය මේ යැයි අප පසුකරන මං සන්ධි, මාර්ග සංඥා, ගුවන් පාලම්, අධිවේගී මාර්ග හා අතුරු පාරවල් ආදිය පසුකර එන ගමනාන්තයක සැබෑ අරමුණ, සැනසීමෙන් දවස ආරම්භ කිරීමේ හා සැනසීමෙන් දවස නිමා කිරීමේ යුද්ධය ජය ගැනීම නොවේ ද?

ජීවිතය සමග නොකඩවා පොරබදන මිනිසා ට මානසික නිදහස සපිරෙන වින්දනයක් වඩාත් අවැසි වන්නේ එහෙයිනි. කවි, ගී, නවකතා, කෙටිකතා, වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍ය, චිත්‍රපට ආදී නිර්මාණාත්මක ප්‍රවේශ සමග අප බැදෙන්නේ, මෙබදු සමාජ ව්‍යුහයක් තුළ මානව දයාව පැතිරවීම, අභිමිවීම දරාගැනීම, කලාව රසවින්දනය, නිර්මාණශීලී ප්‍රකාශන කුසලතා උත්තේජනය කිරීම මෙන් ම විවෘත මනසකින් ලෝකය දෙස බැලීම ට අනායාසයෙන් ම පොළඹවන නිසාවෙනි. අද එබඳු මිහිර අවැසි තැනට ජනමාධ්‍ය තොරතුරු, අධ්‍යාපනය සහ විනෝදාස්වාදය සපයමින් සමාජ මෙහෙවර ඉටුකිරීමේ සුවිශේෂී වගකීමක බැඳී සිටියි. නමුත් සැබෑ ම ගැටලුව වන්නේ සමීප වූ පමණින් ම අද එකී මාධ්‍ය ග්‍රාහකයාගේ රසවින්දනය උදෙසා ඉහත කී මෙහෙවර මැනවින් ඉටු කරන්නේ ද යන්න යි.

වාණිජකරණය ට හසු වූ වින්දන පරාසයක් තුළ බහුතර නිර්මාණ ඒකාකෘතික වීමත්, අධිවේගයෙන් ජීවිතය ධාවනය කරන තරුණ පරපුරේ නිර්මාණශීලි චින්තනය පුබුදුවාලීම ට ඉඩ ඇහිරීමත්, මෙරට බහුතර ජනමාධ්‍ය තම ග්‍රාහකයා ආනන්දයෙන් ප්‍රඥාව ට ගෙනයන කර්තව්‍යයක නිරත නොවීමත් ගැටලුවකි. අලුත් මාන ගවේෂණය වන 21 වන සියවස තුළ පවතින විවිධ මතවාද හා සංකල්ප, නව නිර්මාණ ආකෘති, නව චින්තන රටාවන් සමඟ බැදි සංවර්ධන සැලසුම් හා මහ පොළොවේ වසන මිනිසුන්ගේ සැබෑ අවශ්‍යතා නියෝජනය කළ යුතුව තිබිය දී එසේ නොකරන්නේ මන්ද යන්න විමසිය යුත්තකි.

ජනමාධ්‍ය සංදේශ මඟින් සමකාලීන ග්‍රාහක සිතුම් පැතුම් ප්‍රබල ලෙස මෙහෙයවිය හැකි අතර ඉන් රටක සමස්ත ප්‍රජාවට ම යහපත් හෝ අයහපත් බලපෑමක් ඇති කළ හැක. නමුත් වත්මන් සමාජ තතු අධ්‍යයනය කරන විට පෙනී යන්නේ, සාරවත් අන්තර්ගතයෙන් යුත් ජනමාධ්‍ය සංදේශ අල්පයක් හැරුණු විට, එක ම රැල්ලක රස නිෂ්පාදනය කරමින්  ඉදිරිපත් වන වැඩසටහන් බහුල බවයි. එසේම ඔවුන් විසින් ම නිර්මාණය කරන ලද "සරල රසවින්දන රටාව" තුළ තම ආයතනයේ නම කියවා ගනිමින් මිනිසුන්ගේ හැඟීම් අලෙවි කිරීමත්, ග්‍රාහකයාගේ හදවත සහ මනස අවදිකරවන සංවාද ගොඩනැඟීම අසමත් වීමත්, උද්ගත වූ සමාජ බේදවාෂක බහුතරයක ට සෘජුව හෝ වක්‍රව බලපෑ හේතු සාධක බව පෙනී යයි. එවැනි දුර්වල මගපෙන්වීමක් ලබන ග්‍රාහකයෝ සමාජ හර පද්ධතීන් ප්‍රතික්ෂේප කරමින් ළාමක, බොළඳ සිතුම් පැතුම්වලින් ජීවිතය තීරණය කරති.

ජනමාධ්‍යයේ ප්‍රබල බලපෑමට හසුවන ග්‍රාහක පිරිස අතර බහුල ව සිටින්නේ කුඩා දරුවන් හා තරුණ පිරිස් වේ. කුතුහලය පිරි ඔවුන් ජීවිතය උගන්නේ ද, සමාජය හඳුනාගන්නේද,  හොඳ නරක විග්‍රහ කරගන්නේ ද ජනමාධ්‍ය මගිනි. එබැවින් ජනමාධ්‍ය සංදේශ අන්තර්ගතයේ ඇති මායාව ට පහසුවෙන් ආකර්ෂණය වන ඔවුහු යථාර්ථය නොදකිමින් අදූරදර්ශී ලෙස කටයුතු කරති. මෑත කාලයේ මෙරටින් වාර්තා වූ ඝාතන සිදුවීම්, අපරාධ, දූෂණ, වංචා සහ මත්ද්‍රව්‍ය ජාවාරම් ඇතුළු බොහෝ ප්‍රචණ්ඩ සිදුවීම්වලට අතිශය සවිස්තරාත්මක හා අනවශ්‍ය ප්‍රසිද්ධියක් ලබා දුන්නේ, මෙබදු ලාබාල ග්‍රාහක මනස තුළ වෛරය, ක්‍රෑරත්වය සහ ලිංගිකත්වය ඉස්මතු කරමින් තමා වෙත වැඩි ආකර්ෂණයක් ලබා ගැනීමට ය. ඉන් ජනමාධ්‍ය සිදුකළේ, මිනිසෙකු තැනීමට වඩා මිනිසෙකු නැසීම සාමාන්‍යකරණය කිරීමකි.

තුවාල වූ සමාජයක අවශ්‍යතාව, තවත් තුවාල පාරන්නන් නොව වෙදැදුරන් ය. එබැවින් සැබෑ සන්නිවේදකයා ඉස්මතු වන්නේ නම් ග්‍රාහකයාගේ හැඟීම් දැනීම් ප්‍රවාහයේ සියුම් තැන් ස්පර්ෂ කොට ධනාත්මක සමාජ පෙරළියක් කළ හැක.  එසේම ග්‍රාහකයන් ද අතොරක් නැතිව නැගෙන බාහිර ඝෝෂාවන් අතුරින් තම අභ්‍යන්තරය සුවපත් කරන ආමන්ත්‍රණ තෝරාගැනීමට විචාරශීලී, නිදහස් චින්තකයෙකු වීම අත්‍යවශ්‍ය ය. කියන්නෝ නො ඇසුවත් අසන්නෝ සිහි බුද්ධියෙන් ජනමාධ්‍ය කියවිය යුතු අතර සබුද්ධික ග්‍රාහක ක්ෂේත්‍රයක "තෝරාගැනීම" තීරණාත්මක සාධකයක් බව අමතක නොකරන්න. "ජේන් අයර්" කෘතියේ (ආර්. එන්. එච්. පෙරේරා මහතා විසින් පරිවර්තිත) එක් තැනක චාර්ලට් බ්‍රන්ටේ කතුවරිය මෙසේ ලියා ඇත.

**"පාඨකය ! වෛරය ඇති තැනින් ලැබෙන මාංශ ආහාරයට වඩා ආදරය ඇති තැනින් ලැබෙන පලාවන් ආහාරය අගනා බව මට ප්‍රත්‍යක්ෂ විය."**

✅ යශෝධා චංදලී රාමනායක





**ආයුර්වේද රූපලාවන්‍ය ඩිප්ලෝමාධාරිනී නදීකා මහත්මිය**

බොහෝදෙනා ශරීරය, රූපය ලස්සනට තියාගන්න නොයෙකුත් වෛද්‍ය ප්‍රතිකර්ම අනුගමනය කරවා. ඒ අතර ආයුර්වේද ප්‍රතිකර්ම වලට හිමිවන්නේ සීමිත ඉඩක්. ඊට හේතුවක් ලෙස දකින්න පුළුවන් සමාජයේ පවතින විවිධ දුර්මතයන්. ආයුර්වේදය පිළිබඳ ඒ පවතින සමාජ දුර්මතයන් නිරාකරණය කර ගැනිම සඳහා අද කතා බහට එක්වන්නේ ආයුර්වේද රූපලාවන්‍ය ඩිප්ලෝමාධාරිනී නදීකා මහත්මිය. එතුමිය ආයුර්වේද වෛද්‍ය විද්‍යාව පිළිබඳ දැක්වූ අදහස් මෙසේය.

**01.ඔබතුමිය ගැන හදුන්වා දුන්නොත්,**

මම නදීකා නිශාන්ති අබේවික්‍රම, පදිංචිය කැලණියේ. ඒ වගේම මම රූපලාවන්‍ය පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක්. දැනට අභිරූ ආයුර්වේදය නමින් රජයේ ලියාපදිංචි වෛද්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවා.

**02.හෙළ වෙදකම, දේශීය වෛද්‍ය විද්‍යාව නැතහොත් ආයුර්වේදය යනුවෙන් අදහස් වන්නේ මොකක්ද?**

හෙළ වෙදකම අපේ දේශීයත්වය පිළිබිඹු කරන පාරම්පරිකව පැවතගෙන එන පැරණි වෙදකමක්. ඒවගේම ආයුර්වේදය කියන්නේ ඉන්දියාවෙන් ආරම්භවුවක්. ආයුර්වේදය මහා බ්‍රාහ්මයා මෙන්ම ඍෂිවරු විසින් හඳුන්වා දුන් සාර්ථක වෙදකමක්. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව රෝගීන්ට ප්‍රතිකාර කිරීම මෙන්ම රෝගීන්ට ජිවත්විමටත්, රෝගවලින් ආරක්ෂා විමටත් කියාදෙන වෙදකමක්.

**03.දේශීය වෙදකම හා ආයුර්වේද වෛද්‍ය විද්‍යාව අතර වෙනසක් තිබෙනවාද?**

ඔව්. දේශීය වෙදකම වසර ගණනාවක් තිස්සේ පාරම්පරිකව එන වෛද්‍ය ක්‍රමයක්. මෙහි එන ප්‍රතිකාර ක්‍රම ගොඩක් එකිනෙකට වෙනස්. නාඩි අල්ලා රෝගයක් නිශ්චය කිරීම වැනි නොයෙකුත් ක්‍රම මේ වෙදකම තුළ පවතිනවා. ආයුර්වේද වෙදකම කියන්නේ පෙර සඳහන් කල අයුරින් ඉන්දියාවේ කේරළ ප්‍රාන්තයෙන් ආරම්භවූ දෙයක්. පැරණි ග්‍රන්ථ සියල්ලකම මේ වෙදකම ගැන උගන්වනවා.

**04.ආයුර්වේද වෛද්‍යවරුන් පවසන පරිදි, ආයුර්වේද ප්‍රතිකාර මඟින් රෝග නිට්ටාවටම සුව කිරිමේ හැකියාවක් මේ වනවිට තිබෙනවාද?**

ඔව්. ආයුර්වේදය මඟින් සමහර සුව කළ නොහැකි රෝග සුව කිරිමේ හැකියාවක් තියෙනවා. නිවැරදිව ප්‍රතිකාර කරමින් නිසි අයුරින් එම ඖෂධ පාවිච්චි කරනවානම් ඕනෑම රෝගයක් සුව කිරිමේ හැකියාවක් තියෙනවා. නමුත් කර්මජ රෝග නම් කොටසක් සඳහන් වෙනවා. එම රෝග සුව කිරිම රෝගියාගෙන් රෝගියාට වෙනස්. එම රෝග නිට්ටාවටම සුව කළ නොහැකි අවස්ථා තියෙන්නත් පුළුවන්. නිසි අයුරින් පංචකර්ම ප්‍රතිකාර කලහොත් ගොඩක් සුවකල නොහැකි රෝග සුව කිරිමේ හැකියාවක් වෙදකම සතුව තියෙනවා. ආයුර්වේද වෛද්‍යවරු නොයෙකුත් ප්‍රතිකාර ක්‍රම  භාවිතා කරමින් රෝග සුවකරනවා. අද වෙනකොට සමහර වෙද පරම්පරා අභාවයට ගිහිං. මං හිතන්නේ බටහිර වෛද්‍යවරුන්ගේ බලපෑම නිසා. ඔවුන් මෙම වෙදකම හෙළාදකිනවා. මගේ අදහස, ඔවුන් මේ ගැන නොදන්නාකම නිසා වෙන්න පුළුවන් වැරදි ප්‍රකාශ කරන්නේ. අපේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව බාහිර බලපෑම් ගොඩක් අවම කරනවා. ඒ නිසා මිනිසුන්ගේ අවධානය ආයුර්වේදයට දෙනවනම් හොඳයි.

**05.ආයුර්වේදය තුළ විවිධාකාර රෝග සුව කිරිම සඳහා විවිධාකාර ප්‍රතිකාර ක්‍රමවේදයන් භාවිතා කරනවා කියලා ඔබතුමිය සඳහන් කරා, එවැනි ප්‍රතිකාර ක්‍රමවේදයන් ගැන කතා කරොත්,**

ප්‍රතිකාර රෝගය අනුව වෙනස් වෙනවා. ප්‍රතිකාර ක්‍රම ගැන කතා කරවනවනම් ඒක දීර්ඝව කතා කළ යුත්තක්. ඒක වෙනම මාතෘකාවක්. බෙහෙත් ඔරු, පංචකර්ම, තෙල්ගැල්විම් වගේ ගොඩාක් එකිනෙකට වෙනස් ක්‍රමවේදයන් තියනවා.

06.ආයුර්වේද වෛද්‍ය විද්‍යාව රෝග සඳහා  පමණක් නොවෙයි. රූපලාවන්‍යය ගැටලු විසඳිමටත් බොහෝ දෙනා භාවිතා කරනවා. රූපලාවන්‍ය ඩිප්ලෝමාධාරිනීයක් ලෙස, ආයුර්වේදය හා රූපලාවන්‍ය පිළිබඳව අදහස කුමක්ද?

රූපලාවන්‍ය ගැන කතා කරොත් මුහුණ ලස්සනට තබා ගැනිම පමණක් නොව මුළු ශරීරයම බාහිරව මෙන්ම අභ්‍යන්තරව පිරිසිදු කරන ප්‍රතිකාර ආයුර්වේදය මගින් සිදුකරන්න පුළුවන්. වෙළඳපොලේ පවතින විවිධාකාර ආලේපන වලට වඩා ආයුර්වේදයේ තියෙන ස්වභාවික ප්‍රතිකාර මගින් බාහිර අතුරු ප්‍රතිඵල නැතිව ස්වභාවික පෙනුම පවත්වාගෙන යාමට හැකියාවක් තියෙනවා. විශේෂයෙන් මනස පිරිසිදුව තබා ගැනිම කලයුතුයි. යහපත් සිතුවිලි වර්ධනය කර ගැනිම අනිවාර්යයි.

**07.ආයුර්වේදි ප්‍රතිකාර ක්‍රම මගින් සාර්ථකව රූපලාවන්‍ය ගැටලු විසදීමේ හැකියාවක් තියෙනවද?**

ඇත්තටම ඔව්. ආයුර්වේද ප්‍රතිකාර කියන්නේ 100% ක් ස්වභාවික අමුද්‍රව්‍ය වලින් සාදන බෙහෙත් වට්ටෝරු. කහ, කොහොඹ, වෙනිවැල් ගැට, කෝමාරිකා, සුදු හඳුන්, රත්හඳුන් වගේ ස්වභාවික අමුද්‍රව්‍ය වලින් සකසන රූපලාවන්‍ය වට්ටෝරු තමයි අපි භාවිතා කරන්නේ. වැදගත්ම දේ වතුර. ඒ නිසා කිසිම බයක් ඇති නොකරගෙන තමන්ගේ හිතේ විශ්වාසයෙන් මනස පිරිසිදුව තබාගෙන ප්‍රතිකර්ම කරනවානම් සාර්ථක ප්‍රතිඵල ලගා කරගන්න පුළුවන්.  ස්වභාවික නොවන කිසිදු අමුද්‍රවයක් භාවිතා නොකරන නිසාත්, ශරීරය බාහිරව මෙන්ම අභ්‍යන්තරවද පිරිසිදුව ලස්සනට තියා ගන්න ආයුර්වේද ප්‍රතිකාර උදව් කරනවා.

**08.අවසාන වශයෙන්, රූපලාවන්‍ය ගැටලු විසඳිමේදි තරුණ තරුණියන්ට ලබාදෙන පණිවිඩය,**

ඇත්තටම අද බොහෝ තරුණියන් විවිධ ආලේපන භාවිතා කර විවිධාකාර අපහසුතාවයන්වලට ලක්වෙලා ඉන්නවා. මම කැමතියි කියන්න, මේ ආයුර්වේද වට්ටෝරු ඈත අතීතයේ පටන් ලස්සන වෙන්න භාවිතා කරලා තියෙන ස්වභාවික ආලේපන. ඉතිං තමන්ගේ ස්වභාවික ලස්සන  රැකගන්න නම් ආයුර්වේදි අමුද්‍රව්‍ය නිසි අයුරින් භාවිතා කරන්න, සීයට සීයක් හොඳ ප්‍රතිඵල ලගාකර ගන්න පුළුවන්.

✅ අයි.ගිත්මි හර්ෂමාලි

# අභියෝග වලදී විශේෂයෙන්ම
# කාන්තාවක්ද කියන සාධකය වැදගත් නෑ

**කාන්තා දිනය තේමා කර ගනිමින් අප සමඟ කතාබහට එකතු වන්නේ කාන්තාව හා සම්පව ජීවිතයේ බොහෝ අත්දැකීම් ඇති ක්‍රිස්තු දේව බාලිකා විද්‍යාලයේ හිටපු විදුහල්පතිනිය කකුඩපාදනී කොඩිතුවක්කු මහත්මිය.**

**01.බාලිකා පාසලක ඉගෙනුම ලැබූ ඔබගේ පාසල් කාලය ගැන මතක් කරොත් ?**

මම ඉගෙන ගත්තේ ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලයෙන්. ඇත්තටම පාසල් කාලය ගැන කිව්වොත් හරිම ප්‍රීතිමත් , සහෝදර බැඳීම් තිබුණ සුන්දර කාලයක් . මම ඒ කාලේ ටිකක් දඟ , ඒත් ගුරුවරුන්ට කීකරු ගෞරව කළ දරුවෙක්. ඒ වගේම අසාධාරණයට ඔලුව නැමුවෙ නැති කෙනෙක් . මම පාසල් කාලයේ ගොඩක් බාහිර ක්‍රියාකාරකම් වගේ විෂය සමගාමී ක්‍රිය-ාකාරකම් සිදු කරා . පාසල් ජීවිතය හරියටම අත්වින්-දා කිව්වොත් හරි . යම්කිසි විදියකට මං දරුවො අතරේ හොඳ ගුරුවරයෙක් වුණා නම් , ඒකට මගේ අම්මා තාත්තා වගේම හිටපු විදුහල්පතිනිය සඳවතී විජේතුංග මහත්මිය ඇතුළු ගුරුවරු හේතු වුණා.



**02.ඔබතුමිය රැකියාවට පිවිසින්නේ කෙහොමද**

ගුරුවරු බඳවා ගැනීමේ තරඟ විභාගයට පෙනී සිට විද්‍යාව ගණිතය සහතික ලත් ගුරුවරයෙක් ලෙස මගේ මුල්ම ගුරු පත්වීම කොටගල සිරි පැරකුම් කණිෂ්ඨ විද්‍යාලයට . පාසල් කිහිපයක සේවය කළ මා අවසානයට ගුරුවරයෙක් ලෙස වසර 11 ක් සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ සේවය කළා. පසුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන විභාගය සමත් වී පරිපාලන සේවයට ඇතුළත් වුණා. ඉන් පළමු පත්වීම ලබා රිපන් බාලිකාවෙ නියෝජ්‍ය විදුහල්පතිනිය ලෙස වසර 2 1/2 ක් සේවය කළා . අනතුරුව ක්‍රිස්තු දේව බාලිකා විද්‍යාලයේ විදුහල්පතිනිය ලෙස වසර 13කින් එනම් 2022.12.31 මගේ සේවය නිමා කරා .

**03.බාලිකා පාසලක ඉගෙනුම ලබා බාලිකා පාසල් කිහිපයක සේවය කළ ඔබ කාන්තාව පිළිබඳ ඔබේ වචනයෙන් විස්තර කළොත් ?**

කාන්තාවට සම තැන අවශ්‍යයි කියන කතාව ඇත්තටම මම විශ්වාස කරන්නෙ නෑ . මොකද කාන්තාව සම තැනට වඩා ඉහළ තැනක ඉන්නව . ගෙදර බුදුන් අම්මා කියන තැන ඉඳල සමාජයේ කාන්තාවට ප්‍රමුඛ තැනක් හිමි වෙනව. ඕනම ගෙදරක මම හිතනවා අම්මගෙ දැක්ම තමයි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. මේ වන විට සමාජයේ ඉහළ තනතුරු වල පවා කාන්තාව ඉදිරියෙන් ඉන්නවා . කාන්තාව සමතැන නෙවෙයි හිමි තැන රැකගන්න උත්සාහ කරන්න ඕන .කාන්තාවට සමාජයට ලොකු මෙහෙවරක් කරන්න පුළුවන් . ගෙයක් ඇතුළෙ දරුවො හැදෙන්නෙ අම්මා එක්ක . අම්මගෙ ආකල්ප ගතිගුණ දරුවන්ට යනව . ඉතින් යහපත් සමාජයක් ගොඩනගන්න කාන්තාව සතු ඇති වගකීම අතිවිශාලයි කියලා මම හිතනවා .



**කකුඩපාදනී කොඩිතුවක්කු මහත්මිය**

**04.ජීවිතයේ අභියෝග වලට අපි හැමෝටම එක වගේ මුහුණ දෙන්න සිදුවෙනවා . එහෙම අභියෝග ඔබේ ජීවිතය තුළත් තියෙන්න ඇති කාන්තාවක් විදියට අභියෝග වලට මුහුණ දෙන්න ඕන කෙහොමද ?**

අභියෝග වලදී විශේෂයෙන්ම කාන්තාවක්ද කියන සාධකය වැදගත් නෑ . දරුවෙක් , වැඩිහිටියෙක් කාන්තාවක් , පිරිමි කෙනෙක් කවුරු වුණත් තමන්ට එන අභියෝග වලට නිවැරදිව හඳුනාගෙන ඊට නිවැරදිව මුහුණ දෙන්න ඕන . කාන්තාව මෙහෙම විය යුතුයි යන සමාජ මතිමතාන්තර වලින් ඈත් වෙලා ජීවිතයට මුහුණ දෙන්න ඕන . දරා ගැනීමේ උපරිමය තියන ගැහැණිය හැම අතින්ම ශක්තිමත්. ඉතින් අවස්ථාවට අනුව නිවැරදිව ක්‍රියාත්මක වීමෙන් අභියෝග ජයගන්න පුළුවන්.



**05.වර්තමානය වන විට තරුණ පරම්පරාව බොහෝ සෙයින් සියදිවි නසා ගැනීමට යොමු වෙලා තියෙනවා . ඔබ හිතන විදියට මේකට හේතුව කුමක්ද?**

මේකට හේතු ගණනාවක්ම තියෙනවා මූලික වශයෙන්ම අධ්‍යාපන ක්‍රමය . පුංචි කාලේ අපි ලෝවැඩ සඟරාව ඉගෙන ගත්තා , ආත්තම්මා සීය එක්ක සුරංගනා කතා රජවරු ගැන කතා බෞද්ධ කතා ඇහුවා . ඒවා අපේ හිත් ඇතුළට බරපතල විදියට කිඳා බැස්සා. දැන් දරුවන්ට එවැනි දේ පරිශීලනයට ඉඩක් නෑ . ඒ වගේම අපි ගෙදර ,අසල්වාසීන් , නැදෑයො හා සමීපව ජීවත් වුණා . වචන තුළ පවා බැඳීම් තිබුණා . ඉතින් ඒ ඇතුළෙ දරුවන්ට වැරැද්දක් වෙන්න ඉඩක් තිබුණෙ නෑ . පහුකාලීනව තාප්ප වලින් වට වුණ ජීවිත ගොඩනැගුණා . මම හිතන්නේ තාපවලින් වට වෙලා සමාජයක් පරිසරයක් අසල්වැසියෙක් එක්ක බාහිරයත් එක්ක කිසිම සම්බන්ධයක් නැතුව මිනිස්සු හුදකලාවෙ තනි වුණා . මෙතනදි දරුවන්ට ප්‍රශ්න කියන්න කෙනෙක් නෑ . දරුවන්ව අහන්න කෙනෙක් නෑ . පාසල් පද්ධතිය තුළත් ගුරුවරු තරඟකාරී අධ්‍යාපන ක්‍රමය ඇතුළෙ හිරවෙනව . දරුවන්ගේ ආකල්ප කුසලතා වර්ධනය බලන්න වෙලාවක් නෑ . දරුවො ප්‍රශ්න හිත් ඇතුළෙම ගුලි කරගෙන ඉන්නව. ඒ ප්‍රශ්න දිග ඇරෙද්දි දරුවන්ට මානසික ආතතිය හට ගෙන පුපුරා යෑමක් සිදු වෙනව ඉතින් දරුවො මේ හුදකලාවෙන් මුදා ගන්න පාසල් තුළ ක්‍රමයක් ගොඩනැගිය යුතුයි

.

**06.ලංකාවේ අධ්‍යාපන රටාව වෙනස් විය යුතු ද ?**

විය යුතුද නෙවෙයි අනිවාර්යයෙන්ම වෙන්න ඕන . වර්තමාන අධ්‍යාපනය දැනුම කුසලතා ආකල්ප කියන තුනම නම් කළ දැනුම පමණක් කේන්ද්‍ර වූ කටපාඩම් අධ්‍යාපනය ක්‍රමයක් . විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා වෘත්තීය මඟ පෙන්වීමක් දක්වා වෙනස් විය යුතුයි . රැකියාවක් ගැන කතා කරත් උසස් යැයි සමාජයේ විසින් වර්ග කළ රැකියා කිහිපයක් පිළිබඳ පමණයි අවදානය යොමු වෙන්නේ .දරුවන්ට ඔවුන් දක්ෂ ක්ෂේත්‍රයක් තෝරා ගෙන ඉදිරියට යන්න විදියක් ගොඩනැගෙන්න ඕන . අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් පවා සැලකිය යුතු වෙනසක් වෙලා නෑ . සමාජයේ මොනව හරි වැරැද්දක් තියෙනවා නම් එ"හැමදේටම අධ්‍යාපනයද වගකිව යුතුයි .

**07.දියණියන් රැසකට මවක් වූ ඔබට අවසන් වශයෙන් දැයේ දියණියන්ට දිය හැකි අවවාදය කුමක්ද ?**

මගේ ආදරණීය දියණියන්ට මම දෙන එකම අවවාදය පුළුවන් උපරිම ඉගෙන ගන්න . තමන්ගේ උපරිම කැපවීමෙන් යන්න පුළුවන් උපරිම තලයකට මොන අංශයකින් හෝ යන්න උගත්කම කාන්තාවකට ආභරණයක්. ආර්ථිකය ශක්තිමත් කරගන්න . ස්වාධීන වෙන්න . ගෙයක් ඇතුළත සාමකාමී ප්‍රීතිමත් වෙන්න මේ සියළු සාධක එකතු වෙන්න ඕන . සාමකාමී ගෙයක් සාමකාමී සමාජයක් බිහි කරන්න හේතු වෙනවා . ඒ වගේම තමයි හැම කාන්තාවක්ම තමන්ගේ ආත්ම ගරුත්වය රැකගෙන ජීවත් වෙන්න ඕන කියල මම විශ්වාස කරනවා.

කාන්තා දිනය හා සමගාමීව වටිනා අදහස් බෙදා ගත් ක්‍රිස්තු දේව බාලිකා විද්‍යාලයේ හිටපු විදුහල්පතිනිය වන, කකුඩපාදනී කොඩිතුවක්කු මහත්මියට අපගේ ස්තූතිය.


✅ **හිමාෂා රණතුංග**

"පාඨකයාගේ පර්යාවලෝකය සඳහටම වෙනස් කළ හැකි කෘතියක් දශක දෙක තුනකට වරක් බිහිවෙයි" ( සන්තියාගෝ නම් සැරිසරන්නා) Paulo Coelho de Souza සම්පූර්ණ නම වූ අතර ඔහු 1948 වර්ෂයේ අගෝස්තු 27 වන දින ප්‍රසිද්ධියෙ රියෝ ද ජැනෙයිරෝ නගරයේ බොටාෆොගෝ හිදී උපත ලබන ලදී. පාවුලෝ කතෝලික වූ අතර ඇගේ මව වන ලඟියා අරාරිපෙ විසින් උපන් රෝහලේදීම ඔහු ව බෞතිස්ම කරනු ලැබීය. පාවුලෝ කොයියෝගේ පියා පෙද්රෝ ක්වීමා කොයියෝ ඊංකියා වශයෙන් ඉංජිනේරු වෘත්තිය කරනු ලැබූ අයෙකි. පියාගේ එකම බලාපොරොත්තු වූයේ තම පුතු නීතිඥයකු වන දැකීමයි. පාවුලෝ හට නීතිඥ සිහිනය කුඩා කල සිටම මනසට ඇතුළත් කරද ඔහුට අවශ්‍ය වන්නේ කලාකරුවෙකු වීමටයි. එමෙන්ම මොහු කුඩා කල පාසල් අධ්‍යාපන ලබන වයසේදීම ජෝර්ජ් ලුයිස් බෝර්ගස් හා හෙන්රි මිලර්ගේගේ කෘතීන් කියවීමට යොමු වී ඇත. ඒ අතර වේදිකා නාට්‍ය කෙරෙහි යොමු වීමට ද පාවුලෝ කුඩා කල සිටම උත්සහ දරනවා.

පාවුලෝගේ අධ්‍යාපනයේ ප්‍රගතිය එතරම් සාර්ථක නොවූ නිසාවෙන් ඔහුගේ දෙමව්පියන් විසින් පාවුලෝ ව දැඩි විනයක් යටතේ පාලනය වන ජෙසුයිට් නිකායේ පාසලකට ඇතුළත් කිරීමට කටයුතු කළා. මෙයට තවත් එක් හේතුවක් වූයේ පාවුලෝ කුඩා කල සිටම කැරලිකාර චින්තනයන්ගෙන් යුක්ත වීමයි. නමුත් ඔහු මෙම පාසලට ඇතුළත් වීමෙන් පසුව නාට්‍ය කෙරෙහි තිබූ ආශාව වඩාත් ඉස්මතු වූ අතර ඔහු පාසලේදී තම ප්‍රථම නාට්‍ය තරඟයෙන් ජයග්‍රහණයත් හිමිකර ගනු ලැබුවා. එමෙන්ම පවුලෝ තරුණ වියේදී කිසිදු පොදු පිළිගත් මතයකට අනුකූල වූවෙක් නොවේ. ඔහු අලුත් එවා සොයා යන්නෙක් විය. ඒ අනුව ඔහු 1968 වසරේදී ක්‍රියාත්මක වූව මැතිවරණ හා පෙළපාළි කටයුතුවලට ප්‍රගතිශීලී පාර්ශ්වයක් නියෝජනය කරමින් සම්බන්ධ වෙනවා. ඔහු රියෝද ජනයිරෝ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ලියාපදිංචි වුවත් කෙටි කාලයකින් එයින් ඉවත් වෙනවා. මේ අතරවාරයේදී දෙමාපියන් විසින් තරුණ පාවුලෝ තුන්වරක් ම මානසික රෝහලට ඇතුළත් කරනවා. මානසික රෝහලෙන් පැන යන ඔහු ඇමරිකාව බලා පිටත් විය. ඉන්පසුව එහි දී ජීවත්වීම සඳහා තමන්ට අනෙකුත් හිට් තරුණයන් උපකාර කළ බව ඔහු පසු කාලයේදී මාධ්‍ය සාකච්ඡාවකදී පවසා සිටිනවා.

ලිවීමට තිබූ බලවත් ආශාව හේතුවෙන් ඔහු පුවත්පත් කලාවට අවතීර්ණ වන අතර 2001 නමින් විකල්ප සඟරාවක් ආරම්භ කරන ලදී. නමුත් ඔහුට මෙම සඟරාවේ නිකුත් කරන්නට හැකි වන්නේ කලාප දෙකක් පමණයි. සඟරාවේ පළ වූ එක් ලිපියක් හේතුවෙන් ප්‍රසිද්ධ සංගීතවේදියකු වූ රාහුල් සෙයික්ෂාන් සමඟ සම්බන්ධයක් ඇතිකර ගැනීමෙන් පසු ඔහු ඔහුට ගී පද රචනා කිරීමට අවස්ථාවක් හිමි වෙනවා. එමෙන්ම රියෝ පුවත්පතක් වූ EL Globo පුවත්පතට ද නවකතා රචනා කිරීම ආරම්භ කරන තුරු ලිපි සැපයීම සිදු කරනවා. ඔහු තම ජීවිතය මුහුණදීමට සිදුවූ කෲර ම අත්දැකීම වන්නේ බ්‍රසීලය ඒකාධිපති පාලන සමයේ හමුදා ඇඳුමට සමාන ද මෙහිදී පුද්ගලයන් පිරිසක් පාවුලෝ පැහැරගැනීම හා ඔහුට වධ හිංසා කිරීම බව ඔහු පවසනවා. එමෙන්ම පාවුලෝ හට එයින් ගැලවීමට වාසනාව ලැබී තිබෙනවා.

විශේෂ අවස්ථාවක් එනම් ජීවිතයේ හැරවුම් ලක්ෂයක් ලෙස ඔහු 1976 වසරේ දී ප්‍රසියානු වාර්තාකරුවකු ලෙස එංගලන්තයට යන අතර ඔහු එහිදී ප්‍රමුඛ ජීවිත කතාව ලියා අවසන් කළ ද බ්‍රසීලයට යාමට පෙර එම පිටපත් ලන්ඩන් නුවර දී යම් ස්ථානයක අමතක වී දමා ගොස් ඇති නිසාවෙන් ඔහුගේ ජීවිත කතාව කිසිම දිනක ග්‍රන්ථයක් වශයෙන් මුද්‍රණය කිරීමට හැකි වී නැත. වර්තමානයේ ස්වතන්ත්‍ර නවකතා වලට සාපේක්ෂව පරිවර්තන පොත් වලට විශාල ප්‍රගතියක් හා ප්‍රසිද්ධියක් බිහි වී ඇති බව දැකගන්නට පුළුවන එම නිසාවෙන් බොහෝ පිරිසක් අද වන විට පරිවර්තන කෘතීන් කියවීමට



**පාවුලෝ කොයියෝ**
**Paulo Coelho**

විශාල නැඹුරුවක් ඇති කරගෙන ඇත එම නිසා පාවුලෝ කොයියෝ ප්‍රසිද්ධ කතා කතුවරයෙකු වූ ඔහුගේ පොත් පිළිබඳ වර්තමානය තුල කතාබහට ලක්වෙනවා. 1986 වසරේදී පවුලෝ තම බිරිඳ බොන්න ක්‍රිස්ටිනා ඔයිටිසිකා සමඟ ලොව පුරා සංචාරය කිරීමට තීරණය කරන ලදී. ඔවුන් ප්‍රථම nuwaragala ලබන්නේ ස්පාඤ්ඤ යයි ඔහු එහිදී ලබන අත්දැකීම් පාදක කරගමින් ගනිමින් ඔහුජ් ප්‍රථම නවකතාව වන "The pilgrimage " කෘතිය රචනා කරනවා.

## "යමෙක් සිය ඉරණම ලුහුබැඳ යාමට එඩිතර වන්නේ නම් ඔහුට එය ජය ගැනීමට උපකාරී වීම පිණිස මුළු ලොවම පෙළගැසෙයි"

එමෙන්ම ඔහුගේ දෙවන නවකතා වන 1984 දී රචනා කළ "the alchemist" නම් චූලානන්ද සමරනායක මහතා විසින් සිංහල පරිවර්තනය කරන ලද සන්තියාගෝ නම් සැරිසරන්නා නවකතා විසින් පාවුලෝ කොයියෝව ලෝකේ ජනප්‍රිය නවකතාකරුවෙක් බවට පත් කරනවා. මෙම කෘතිය පිටපත් දළ වශයෙන් මිලියන 35ක් පමණ ලොවපුරා විකිණී ඇති බවයි පැවසෙන්නේ. එමෙන්ම විශේෂ අවස්ථාවක් ලෙස ජීවත්ව සිටින ඔහුගේ කෘතියක් වැඩිම භාෂා ප්‍රමාණයට පරිවර්තනය වීමේ වාර්තාවට ද හිමිකම් කියන්නට පාවුලෝ සමත් වෙනවා.

එමෙන්ම මෙම කෘතිය සරල කතන්දරයක් වුවත් මෙහි සෑම පිටුවක්ම ජීවිතය ජය ගන්නට පණිවිඩයක් අඩංගු වන බවත් එය ජීවිත වල විශාල අත්දැකීමක් වන බවත් පෙන්වා දිය හැක. එම නිසාවෙන්ම බොහෝ පිරිසක් කියවිය යුතු කෘතියක් ලෙස මෙය පෙන්වා දිය හැකිය. එමෙන්ම ඔහුගේ තවත් කෘතියක් වන " 11 minutes " මිනිත්තු එකොළහේ කතන්දරේ මෙම කෘතිය සිංහල පරිවර්තන දෙකක් දක්නට ලැබේ. ආනන්ද මහපටුනගේ සහ රුචිනි තල්පාවිලගේ යන පරිවර්තකයින් දෙදෙනාම මෙම කෘතිය සිංහලයට පරිවර්තනය කර ඇත. කතා නායිකාව හා කතාවට පාදක වන්නේ මරියා නම් බ්‍රසිල ගණිකාවගේ කතාවයි. මෙම කතාව තුළ හිතන්න ගොඩක් දේවල් ඇති කතාවක් ලෙස පෙන්වා දිය හැකිය.

ඔහුගේ තවත් එක් කෘතියක් වන "Veronika decides to die " සිංහලයට පරිවර්තනය වන වෙරෝනිකා මැරෙන්න තීරණය කරයි කෘතිය ලංකාවේ අතිශය ජනප්‍රිය වුණු කෘතියක් බවට පත්විය. මෙය සිංහලයට පරිවර්තනය කරන ලද්දේ ගාමිණී වියන්ගොඩ මහතා ය. මෙම කතාවට පත්වන්නේ ඒකාකාරී ජීවිතය ගැන කලකිරීමට පත්ව සියදිවි හානි කරගැනීමට තැත් කරන තරුණියක් එම වෑයම අසාර්ථක වීමෙන් පසුව ජීවිතයට මුහුණ දෙන ආකාරය පිළිබඳවයි. මෙම කෘතිය පාඨකයාගේ හදවත සහ බුද්ධිය යන දෙකටම සමසේ ආමන්ත්‍රණය කරන ආකාරය දකින්නට පුළුවන.

එමෙන් ම "Adultery" මොහුගේ තවත් කෘතියක් විය. මෙහි සිංහල පරිවර්තනය අනාචාරය නම් විය. මෙය සිංහලට පරිවර්තනය කරන ලද්දේ මැනුවෙල් ජයසේකර මහතා විසිනි මෙම කතාවට මූලබීජය වන්නේ නීරස ජීවිත ගත කරන විවාහක කාන්තාවක් තමන්ගේ පැරණි පෙම්වතකු සමග ආරම්භ කරන අනියම් සම්බන්ධතාවයයි. "witch of protobello" කෘතිය එනම් සිංහල පරිවර්තනය වන මායාකාරි කෘතියයි. කෘතිය උදිත අලහකෝන් සිංහලට පරිවර්තනය කරන ලදී. මෙම කතාව පුරාවටම කියවෙනුයේ ආදරය ගැනයි.

## "මම මැරුනම මගේ මිනිය කෙලින් අතට වළලන්න මොකද, මං මගේ ජීවිත කාලෙම ගත කරලා තියෙන්නේ දණගහගෙන හින්දා"

පවුලෝගේ තවත් කෘතියක් වන "බ්‍රීඩා" මෙම කෘතිය සිංහලට පරිවර්තනය කරනු ලබන්නේ මහේෂි වීරකෝන් විසිනි. මෙය ලෝකය පුරාවට ජනප්‍රිය වූ තවත් එක් විශිෂ්ට කෘතියකි. මෙම කතාව තුළ මිනිස් ලෝකෙ ගැඹුර තරමක් ගුප්ත ලෙස ඔහුගේ අනෙක් පොත්වල ලෙසම මෙම කෘතිය තුළත් මුණගැසෙනවා. එමෙන්ම පවුලෝගේ සිංහලට පරිවර්තනය වූ යක්ෂයා හා ප්‍රයිම් මෙනවිය කෘතියත් ඉතා විශිෂ්ට කෘතියක් ලෙසත් පෙන්වා දිය හැක. මෙය සිංහලට පරිවර්තනය කරනු ලද්දේ චූලානන්ද සමරනායක මහතා විසිනි.

එමෙන්ම මේ කෘතීන්ට අමතරව පාවුලෝ කොයියෝ නම් විශිෂ්ට නවකතාකරුවාගේ පියෙද්රා ගඟබඩ හිඳ මම වැළපුනෙමි, අක්‍රාවේ අත්පිටපත, සහීර්, මා නොවන මම , ඔත්තුකාරී යන කෘතීන් මෙලෙස සිංහලයට පරිවර්තනය විය. The Economist සඟරාවට අනුව ලතින් ඇමරිකානු ග්‍රන්ථ කතුවරුන් අතරින් කොලොම්බියානු ජාතික ලේඛක ගබ්රියෙල් ගාෂියා මාකේස්ට පසු වැඩියෙන් ම ජනාදරයට පත්වූ ලතින් ඇමෙරිකානු ලේඛකයා පාවුලෝ කොයියෝ බව පෙන්වා දී ඇත.

✅ පී.පෙරේරා

# රූමඩල

## කොමඩු හේන

(නිමිත්ත : 2017 එක්තරා දවසක යෝධ ඇළ වම් ඉවුරේ ගම්මානයක , කොමඩු හේනකදී ' තනියා ' නමින් හැඳින්වෙන වල් අලියෙකුගේ ප්‍රහාරයකින් වයස අවුරුදු තුනක් වූ ගැහැණු දරුවෙකු මිය යයි )

දාහයම වරනගන අඳුරු කළු දහවලේ ...
තනියෝ උඹ ආපු දා යෝධ ඇළ කණ්ඩිය දිගේ...
අම්මා එක්කලා චුටි නංගිත් කොමඩු හේනට ඇවිත් තිබ්බේ...
ඉරි තැලුණු පොළව එක්කලා ඔට්ටු වෙන්නයි ජීවිතේ ....

ලේ වලින් පෙඟුණු පොළවක තනියාගේ පා ලකුණු තිබ්බා...
චුටි නංගී දන්නවා ද තාත්තා මහ පොළවේ හැපුණා...
යෝධ ඇළ දෙකොපුලෙන් බොර පාට බර කදුළු වැටුණා...
“තනියෝ ” උඹ ආපු දවසේ අපේ ගෙදර මිණි පහන නිවුණා...

එක් පෙති - දෙපෙති පිපි හරි හැඩට
පැල පත වැඩී ආ හැටි යසට
අයියනායක දෙයියෝ ! ඇස් ඇර නොබැලුවේ මන්ද ?
කොමඩු හේනක් අද්දරදී මිළිණ වෙනකොට කිරි කවඩි මල් කැකුළ ....

ගොම මැටි ගාපු සුදු පිරිමැදි බිත්තිවල,
අඟුරු කැට වලින් උඹ ඇදපු බලිකුරුටු චිත්‍ර වල...
පණ තියෙන බව හිත හිතා ඇත්තටම ...
අම්මා ඒවා ඉඹින බව දන්නවා ද  මහරෑට...

දෑල බඩ තුරු හිස් අතර උඹ ආස මල් තාම පිපෙනවා...
චුටිගේ මතක අරගෙන යෝධ ඇළ  තාම ගලනවා...
ඉඳ හිටක තනි අලියා ඈත ඉවුරේ ඉන්නවා...
උඹේ ටිකිරි හිනා හඩ ! ඔව් , පොඩ්ඩියේ මට තාම ඇහෙනවා...

ඉල් මහේ වැහි නාපු හින්දා තනියා ඉන්නැති හාමතේ...
හෙට අනිද්දා නංගීගේ දානය තියෙනවා තුන් මහේ...
අත් ඇරපු අපේ කොමඩු හේනේ කොමඩු හැදිලා ඇත ඔහේ...
ඇවිත් කාපන් ඇති තරම් දැන් අපේ තරහක් නෑ හිතේ...

| ටානියා එදිරිසිංහ |

## තනි යහන

නග්න සිරුරද
නග්න හදවතද
ගිනියමින් දැවෙන මෙහොතක
ග්ලැසියරයක සුව සදන
සිහිල් සුව පුදසුනකි...

නග්න සිරුරක
කෝමල රටා මත...
තනිව දිව යන
රතැඟිලි පහස...
සෙමි සෙමින් උස් වන
නිරුවත් ළය...
දිව්‍යමය නිහාරිකාවක
නග්න ඇවිදීමකි...

අඩවන් දැගැටි ඇස්
ස්වයං රාගයෙන් මුසපත්ව...
සිහින් කෙඳිරුම් පවා
රහසේ තනිව විඳින...
සොදුරුම ස්වයංභාෂණයක
ගිනිකදු පුපුරා නිවෙන...
හුදකලාම උල්පත් රහසේ ඉපිද
රහසේම වියැකීයන...
හාදු නොමැති
තනි යහනකි...

| මංගලා පවිත්‍රානි |

## ගැහැණු කෘති

පිටකවර ගැලවුණත්
පරණ පිටු පුරා
ලිවී ඇත පදගණන්
නුරා පසුකර ගිය කතා

වදන් නොදන්න
ඒ පිරිමි සතා
කියෙව්වෙම
ගැහැණු කෘති
අත්පයින් ඉරා

වදනක් දෙකක් දන්නා
පිරිමි පවා
කියෙව්වෙම
ගැහැණු කෘතිවල
තිබ්බ නුරා

ලේසි නැ කියවන්න
ගැහැණු කෘතිවල
තිබ්බ කතා..

| අරුණි ශාහයක්කාර |

## බලාපොරොත්තුව...

හමුවන දකින නිරතුරැ නුඹ උදේ හවා
විසිරැණු සිතක කකියන පෙම හිමි නැතුවා
බෙදුවත්  කුල සිරිත බැමි බැද හිත ඇතුවා
කෙදිනක එයිද නිදි නැති නෙත මඟ බැලුවා...

එනතුරැ මඟ බලා සිටිනෙමි දැකගන්න
පියවර ගණිමි මල් පාවඩ අතුරන්න
මුරකාවල් පවුරැ බිද හැර දා එන්න
මියැදුණු සිහින මත යළි සුසුමක්වෙන්න...

නුඹ එයි කියා මගෙ නෙතුපිය වෙහෙසෙයි නම්
පවරමි සදා දිවියම මගෙ  හද තුලෙන්
සිහිනෙන් වගේ ඇවිදින් මට කිව්වෝතින්
සත්තයි පුදමි හදවත මේ මල් දෝතින්....

| කවිමිණී බොරලැස්ස |

## රජකි නුඹ මට අප්පච්චි ...

නගන රළ රැලි මිහිරි ස්වරයෙන්
නිහඩ වී නුඹ
දරා හුන්නා හැම විටම
කටු ඔටුනු නුඹ හිස තියන්
රන් කිරලු මා හිස සරහන්නට
මහ පොළොව හා ගැටී   නුඹ
නේක දුක් විදින්නැති මා පිනවන්නට..
මුදු මොලොක් සුසිනුදු මගේ දෙපතුල්
විල්ලුද ඇතිරු මගක යවන්නට
දෑතේ විරිය උදැල්ලට දී
උත්තරීතර වූ නිහඩ ස්වර බැල්මෙන්
සොදුරු ගුණ කැටි කරමින්
ජීවිතේ නැළවිල්ල මට ගයමින්
උත්තරීතර නුඹ
අප්පච්චි....
ඒ නුඹ හැර වෙන කෙනකු වේද මේ
ලොව මට සිටින .....

| කවිදු |

**මේ** වෙනකොට ලංකාවක්ම ආදරේ කරන තවත් එක් පෙම්වතෙක් නාරද. එහෙම නැත්තන්, දමිත් ග්‍රේෂන්.

ආයුබෝවන් දමිත්

ආයුබෝවන් !

01. මේ දවස්වල මොකද කරන්නෙ ?

මේ දවස්වල ඉතින් සුපුරුදු පරිදි මගේ රංගන වැඩ කටයුතු ටික කරගෙන සතුටින් ඉන්නව.

02. අපට ඔබේ පෞද්ගලික තොරතුරු ටිකක් කිවුවොත් ?

මම මේ දිනවල කොළඹ ජීවත් වුනත් මගේ ගම කුරුණෑගල දොඩම්ගස්ලන්ද කියන ලස්සන ග්‍රාමය. ඉතින් ඒ ලස්සන ගමේ දෙමාපිය සෙවණෙ සහෝදරයන් දෙදෙනෙක් එක්ක ඉන්න පවුලෙ බාලයා තමයි මම.

03. එතකොට රංගනය ඔබේ ජීවිතයට එකතු වුණේ කොහොමද ?

මම පොඩි කාලෙ ඉඳලම රංගනයට ආසයි. ඒ හින්දම තමයි  ටවර් හෝල් නාට්‍ය හා රංග කලා පාසලටත් එන්නෙ. එහි දී උගත් දෑ සහ සමාජයෙන් එකතු කරගත්ත දේවල් එක්ක තමයි රංගනයට සම්බන්ධ වුණේ.

04. මුලින් කිව්ව වගේ නාරද කියන චරිතය මේ වෙනකොට  ගෑ ළමයි අතරෙ හරි ජනප්‍රිය චරිතයක්. අපි ඒ ගැනත් කතා කරමු.

ඔව් ඇත්තටම නොහිතපු විදිහට නාරදව ප්‍රේක්ෂාකාගාරය භාරගෙන තියනවා. ඒ ගැන හුඟක් සතුටුයි.

**නාරද වෙනුවෙන් පුලුවන් උපරිම සාධාරණයක් කරන්න ඉදිරියටත් බලාපොරොත්තු වෙනවා.**

05. මං මෙහෙම ඇහුවොත්, දමිත් කියන්නෙත් නාරද වගේම ආදරණීය පෙම්වතෙක් ද ?

නෑ. තාම ආදරණීය පෙම්වතෙක් වෙන්න අවස්ථාව හම්බෙලා නෑ. ඉදිරියේ දී බලමු.

06. ජානු කියන්නෙ ඔබේ පළවෙනි ටෙලිනාට්‍ය. ඒ අත්දැකීම කොයිවගේද ?

ඒ අත්දැකීම හරි සුන්දරයි.ඒ වගේම ආදරණීයයි. මං ප්‍රථම වරට රංගනයෙන් දායක වන ටෙලි නිර්මාණය හසුන් සමීර අයියා වැනි සුන්දර මනුස්සයෙක්ගෙ අධ්‍යක්ෂණයක් වීම මගෙ වාසනාවක් විදිහටයි මං හිතන්නෙ.ඒ තරමටම ඔහු හරි ආදරණීය සුන්දර මනුස්සයෙක්. ඒ වගේම නයෝමි අක්කා, එස්. අයි සමරක්කොඩි අයියවත් මතක් කරන්න ඕන මොකද මට ඒ හැමෝම ලොකු හයියක් වුණා මේ ටෙලි නිර්මාණය ඇතුළෙ. ජානු නිර්මාණයෙ සියලුම දෙනා හරිම ආදරණීයයි ඒ නිසා හැමදේම හුඟක් පහසුයි.



07. මීට අමතරම ඔබ සම්බන්ධ වුණු වෙනත් නිර්මාණ ගැනත් ප්‍රේක්ෂකයන්ට මතක් කරමු

මීට, අමතරව මං මුලින්ම තිවංක අයියා අධ්‍යක්ෂණය කළ මියුසික් වීඩියෝ කිහිපයකට සම්බන්ධ වුණා. ඒ අතරින් මනේජ් සංජය සහෝදරයාගේ 'පනට නමක්' ගීත නිර්මාණය සාර්ථක නිර්මාණයක් බවට පත්වුණා .ඒ වගේම වේදිකා නාට්‍ය වලට සම්බන්ධ වෙමින් මුල සිටම කටයුතු කරා.

08. රංගනය ඇරුනාම ජීවිතේ ඉදිරි බලාපොරොත්තු සහ සැලසුම් මොනවගේ ද ?

මම මේ වන විට අධ්‍යාපනවේදී විශේෂ උපාධිය නිමා කරලා ඉන්නෙ. ගුරු සේවයේ නිරත වීමට පොඩි බලාපොරොත්තුවක් තියනවා ඒ වගේම පුංචි ආශාවක් තියනවා ලංකාවෙ එකම එක ෆිල්ම් එකක් හරි කරන්නත්. බලමු ඉස්සරහට

09. මේ ගමන ඇතුළෙ ඔබට ස්තූති කරන්න පිරිසක් ඇති. අපි ඒ අය ගැනත් මතක් කරමු

අනිවාර්යෙන්ම, මට මේ තැනට එන්න හයියක් උන අම්මා, තාත්තා සහ අයියලා දෙන්නා ආදරෙන් මතක් කරන්න ඕන. ඒ වගේම මේ වන තෙක් මට ගුරු හරුකම් දුන්න ආදරණීය ගුරුවරුන් සියලු දෙනාමත් මතක් කරන්න ඕනි. හැමවෙලාවෙම මං එක්ක ඉන්න ඒ අය සහ මගෙ යාලුවො තමයි. ඉතිං නිතරම වචනෙයෙන් නොකිව්වත් ඒ හැමෝටම හැමදාම හදවතින්ම ස්තූතිවන්ත වෙනවා.

10. ඔබේ ඉදිරි අනාගතයට සුබ වේවා කියල අපි ප්‍රාර්ථනා කරනවා.

ඉතිං දමිත් ස්තූතියි අපිත් එක්ක ආදරණීය කථාබහකට මේ විදියට එකතු වුණාට.

ස්තූතියි මාව සම්බන්ධ කරගත්තට.




# දමිත් ග්‍රේෂන්

*Damith Greshan*

✅ මහේෂි දිසානායක

# ගෙදරදීම ලිප් බාම් එකක් හදමු



අද අපි තරුණ පිරිස මුහුණ ගැටළු කිහිපයක් ගැන කතා කරන්නයි යන්නෙ ඉතින් තරුණ අයට තිබෙන, විශේෂයෙන්ම කාන්තාවන්ට තිබෙන ගැටළුවක් ලෙස දෙතොල් අවපැහැ ගැන්වීම, දෙතොල් වේලීම මෙන්ම දෙතොල් පැලීම ආදිය දැක්විය හැකිය. පළමුවෙන්ම දෙතොල් අවපැහැ ගැන්වීමට තුඩු දෙන හේතු කිහිපයක් පැහැදිලි කරන්නම්

1.දෙතොල් හිරු එළියට නිරාවරණය වීම
2.ප්‍රමිතියෙන් බාල රූපලාවණ්‍ය ද්‍රව්‍ය භාවිතා කිරීම
3.සීතල කාලවලදී
4.ශරීරය උෂ්ණාධික වීම

යන කරුණු දැක්විය හැකිය. එම ගැටලුවලට පිළියමක් ලෙස නිවසේදීම ලිප් බාම් එකක් සාදා ගන්නා සාදාගන්නා ආකාරය ...


සාදා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍ය :

1.ඔරිජිනල් වැස්ලින් තේ හැඳි 2 යි
2.ආමන්ඩ් ඔයිල් හෝ ඔලිව් ඔයිල් තේ හැඳි බාගයක්
3.සීනි තේ හැදි භාගයක්
4.ග්ලිසරින් තේ හැඳි කාලක්
5.මී පැණි තේ හැදි කාලක්
6.විටමින් E කරලක්

සාදාගන්නා ආකාරය :

වැස්ලීන් තේ හැඳි දෙකක් පළමුවෙන්ම භාජනයකට හෝ හැන්දක් මතට දමා ආමන්ඩ් ඔයිල් හෝ ඔලිව් ඔයිල් තේ හැඳි භාගයක් ද එක්කර දෙතොල් අවපැහැ ගැන්වී ඇත්නම් හෝ දුර්වර්ණ වී ඇත්නම් සීනි හැඳි බාගයක් යොදාගෙන ඉන්පසු ඉටිපන්දමක් ආධාරයෙන් ද්‍රාවණයක් වන තෙක් රත් කර නිවා ගත් පසු දෙතොල් වලට තෙතමනය වැඩි කර ගැනීමට සමත් ගීසරින් තේ හැඳි කාලක් හා මී පැණි තේ හැදි කාලක් එකතු කර ගත් ධාවනයට විටමින් E කරලක එකතු කිරීමේ දී එය අවසානයට එකතු කරගන්න මතක තබා ගන්න

# ඉස්සොරි ගැටලු අවම කර ගමු



ගැහැණු පිරිමි භේදයකින් තොරව තිබෙන හිස්සොරි ගැටලුව අවම කර ගැනීමට පිළිපැදිය යුතු පියවර කිහිපයක් ලෙස,

- පළමුවෙන්ම තමන් පිරිසිදුව සිටිය යුතු අතර දවසක් ඇර දවසක් ස්නානය කළ යුතුය.
- තමන් නිදා ගැනීමට භාවිතා කරන කොට්ට උර ඇඳ ඇතිරිලි සතියකට වතාවක්වත් පිරිසිදු කළ යුතුය.
- තමන්ටම වෙනම භාවිතා කිරීමට පනාවක් තබාගත යුතුය.

විශේෂයෙන්ම තමන්ට ගැලපෙන ෂැම්පු වර්ගයක් භාවිතා කර ස්නානය කිරීම ඉතා වැදගත් වන අතර ඉහත දැක් වු පියවර අනුග මනය කිරීමෙන් තමාට තිබෙන හිස්සොරි අවම කරගත හැකිය.

✅ පන්චලී භාගයා

# නව්‍යකරණයන් සමඟ බිහිවූ නිර්මාණශීලි ව්‍යාපාර

පසුගිය වසර කීපය තුළ විවිධ හේතූන් මත රට අස්ථාවර වීම නිසා වර්තමානය වන විට ශ්‍රී ලංකාව මහත් ආර්ථික දුෂ්කරතාවයකට හා පරිහානියකට පත්ව ඇත. ආර්ථිකය කඩා වැටීම හේතුවෙන් ලංකාවේ රැකියා අවස්ථාවන්ට දැඩි පහරක් එල්ල වූවීමත් සමඟ පසුගිය කාලයේ තම රැකියා අහිමි වූවන්ගේ ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගත් අතර විරැකියාවෙන් පෙළෙන පිරිස් ද පිරිස් ද වර්ධනයක් දැකගත හැකි විය.

අර්බුදකාරී ආර්ථිකයෙන් බැටකෑ තරුණ පිරිස් ද ගෘහණියන් ඇතුළු විවිධ කණ්ඩායම් මේ වන විට ස්වයං රැකියා හා කුඩා ව්‍යාපාර ආරම්භ කිරීමට ද පවත්වාගෙන යාමට ද වැඩි නැඹුරුවක් දක්වන දැකිය හැකිය.  වර්තමානයේ දී ස්වයං රැකියා සහ කුඩා ව්‍යාපාර ඉතාමත් නිර්මාණශීලී මුහුණුවරක් ගන්නා අතර, සමාජ සමාජ මාධ්‍ය ජාල ඔස්සේ තම ප්‍රචාරණයන් සහ විකිණුම් කටයුතු කරගෙන යාම ව්‍යාපාරයන්ගේ නව ප්‍රවණතාවක් ලෙස දැක්ක හැකිය.

නව්‍යකරණයන් සමඟ බිහිවූ නිර්මාණශීලි ව්‍යාපාර ලෙස, මෑතක පටන් තරුණ, වැඩිහිටි භේදයකින් තොරව ප්‍රිය කරන රෙසින් නිර්මාණ, කලාත්මක අත් බෑග්, පාවහන්, විවිධ විලාසිතා සහ නිමි ඇඳුම්, මල් වගාව ආදිය දැකිය හැකිය.

රෙසින් නිර්මාණ ගත් කල මෙම සංකල්පය ශ්‍රී ලංකාවට අලුත් වූ නමුත් විදේශ රටවල අති මහත් ඉල්ලුමක් සහිත සුන්දර කලාවක් බවට පත්ව ඇත.  වර්තමානය වන විට සමාජ ජාල හරහා එම නිර්මාණ කලාව ඉගෙන ගත් බොහෝ තරුණ පිරිස් මෙම සුන්දර සුන්දර කලාව ලංකාව පුරාම ව්‍යාප්ත කරමින් පවතින දැකිය හැකි අතර, මෙම රෙසින් නිර්මාණවලට රට තුළ විශාල ආකර්ෂණයක් හා ඉල්ලුමක් ද විශාල පාරිභෝගික ප්‍රජාවක් ද නිර්මාණය වී තිබෙන දැකිය හැකිය.  රෙසින් කලාව යනු රෙසින් නම් රසායනික ද්‍රව්‍ය උපයෝගී කරගෙන මල් වර්ග, සිප්පිකටු ආදිය විවිධ විසිතුරු දෑ යොදාගෙන කරන නිර්මාණ වන අතර ඒවා උපන්දින තයාග මතක සැමරුම් වශයෙන් තෑගි කිරීමට හෝ විසිතුරු භාණ්ඩ ලෙස තබා ගැනීමට බොහෝ දෙනා පෙළඹී ඇත.

වර්තමානයේ වැඩි වශයෙන් තරුණියන් අතර ජනප්‍රිය විලාසිතාවක් හා ව්‍යාපාර අවස්ථාවක් වශයෙන් ගෙතුම් කලාව දැක්විය හැකිය. කාලයක් වැඩි අවධානයකට ලක් නොවූ ගෙතුම් කලාව ද නව ව්‍යාපාරයක් වශයෙන් සමාජගත වීම නව ප්‍රවණතාවක් ලෙස දැක ගත හැකිය.  එම...න් රැකියා අහිමි වූ හෝ රැකියා විරහිත ප්‍රජාව ස්වයං රැකියාවක් ලෙස ගෙතුම් කලාවේ නිරත වීමට අවස්ථාව ලැබීම සතුටට කරුණකි. වර්තමානය වන විට ගෙතුම් කලාව ද නව්‍යකරණය වී ගොතන ලද බෑග් ගොතන ලද හිස්වැසුම්,  මුදල් පසුම්බි මෙන්ම ගොතන ලද ඇඳුම් ද වෙළෙඳපොළේ දැකිය හැකිය.


ගෙතුම් කලාව වර්තමාන තරුණ තරුණියන් අතර ජනප්‍රිය කරවීමට සමාජ මාධ්‍ය බලපෑම ද ඉවහල් වූ බව කිව හැකිය.  සමස්තයක් වශයෙන් ගත් කල වර්තමානය තරුණ තරුණියන් මෙන්ම වැඩිහිටියන්ද කුඩා ව්‍යාපාර ස්වයං රැකියා හා නව්‍ය අදහස් ක්‍රියාත්මක කිරීමට පෙර වීමේ වැඩි ප්‍රවණතාවක් ඇති අතර, මෙම ව්‍යාපාරික ප්‍රජාවගේ ප්‍රචාරණ මාධ්‍යය බවට සමාජ ජාලා පත්ව ඇත.


මන්ද සමාජ ජාලා තුළින් තම ව්‍යාපාර ප්‍රචාරය කිරීමේදී හා අලෙවි කිරීමේ දී අමතර වියදමක් හෝ වෙහෙසක් දැරීමට සිදු නොවීම මෙන්ම, මුහුණු පොත වැනි සමාජ මාධ්‍ය මඟින් බහුතර ප්‍රජාවකට ආමන්ත්‍රණය කිරීමට හා තම නිෂ්පාදනයන්ට ඉතා පහසුවෙන් පුද්ගලයන් ආකර්ෂණය කරගැනීමට හැකියාවක් පවතින බැවිනි.

අවසානයේදීත් කුඩා ව්‍යාපාරයට හා අලුතින් බිහිවන නව්‍ය අදහස් වලට හදවතින්ම සුබ පතන අතර,  මෙම ව්‍යාපාරය ශක්තිමත් වී ඉදිරියට ගියහොත් ලංකාව ද නිෂ්පාදන ආර්ථිකයක් ඇති රටක් බවට පත්වෙනු නිසැකය.




















✅ එච්.ඩබ්ලිව්.එම්.පවිත්‍රානි




# පොල් වගාව

ඉඩම් කට්ටිකිරීම, කෘමි උවදුරු මැඩ පැවැත්වීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොතිබීම පොල් වගාව පරිහානියට හේතු විය. විවෘත ආර් සපුගස්කන්දෙ යූරියා පොහොර කර්මාන්ත ශාලාව ගලවා පරණ යකඩ වලට විකුණා දැමීම නිසා ඇතිවූ පොහොර හිඟය හා ඇතිවූ අධික මිල පොල් වගාවට මෙන්ම සියලුම වගාවන්ට බලපෑ කරුණකි. අද පොල් කර්මාන්තයට බලපා ඇති ප්‍රධානතම ගැටලුවක් වී ඇත්තේ පොල් කැඩීම සදහා ශ්‍රමිකයන් නැති වීමයි. කෙකි මඩුවත් අද අක්‍රීය වෙමින් පවතී. ලංකාවෙ පධාන අපනයනය බෝගයක් වූ පොල් අද වනවිට ආනයනය කිරීමට සිදු වීම ඉතා සෝචනීය කරුණකි. මෙසේ සියලුම වගාවන් පරිහානියට පත් වෙමින් තිබෙන රටක කෘෂිකර්මාන්තය වෙනුවෙන් ජාතික ධනය කා දමන දෙපාර්තමේන්තු, අධිකාරි , සංස්ථා එමටය.මෙය ජාතික අපරාදයකි. මෙයට ප්‍රධානතම හේතුව මෙම දෙපාර්තමේන්තු සඳහා පත් කරන සියලුම දෙනා නුසුදුස්සන් වීමද ? බැරිකමද ? ඕනැකමක් නැති කමද ? එසේත් නැත්නම් බලපැම් ද ? යන්න සැලකිල්ලට ගත යුතුය.

එදා රතු කුරුමිනි උවදුරු මැඩපැවැත්විම සඳහා වතුවල බූරුවන් ඇති කරන ලදි. ඔවුන්ගේ කැගෑසිම කුරුමිනියන් පලවා හැරීමට ගත් උපක්‍රමයකි. තරුණ පොල් ගස් වල කරබඩය නිතර සුද්ද පවිත්‍ර කර තැබීම තවත් උපක්‍රමයකි. පොල් ගස් කපා ඉවත්කිරීමේදි පොල්කරබඩ පුලුස්සා දැමීමෙන් කෘමි උවදුර මර්දනය කරගත හැකිය.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන්ද මේ සඳහා බෙහෙත් නිපදවා ඇත. මයිටා උවදුර පොල් වගාවට ඉමහත් බාධාවකි. විශ නාසක පොල් ගස් කරබඩයට ඉසීමෙන් මයිටා උවදුර මර්දනය කළ හැක. පරාග පෝෂණයට බාධාවක් පවතින මී මැස්සන් වදවිම හා මී පැණි ආනයනය ට සිදු වීම ට ප්‍රධානතම හේතුව ඇකේෂියා ශාකය රට පුරා බෝ වීමයි. එවැනි අහිතකර ශාක රටින් තුරන් කිරීමට වග බලාගත යුතුය. අප රට විනාශ කිරීම සඳහා බහුජාතික සංවිධාන මඟින් කරන අහිතකර ශාක බෝ කිරීම හා  අහිතකර කෘමින් පරිසරය ට මුදා හැරීම පිළිබඳ දේශිය පරිසර සංවිධාන විසින් ඉදිරිපත් කරන මතවාද කෙරෙහි රජය, පරිසර අමාත්‍යංශය මීට වඩා සැලකිමත් විය යුතුය. රටට හෙන ගැහුවත් තම මඩිය තර වෙනවා නම් මුනිවත රකින අය නැතුව ද නොවේ. මෙම බාධක මැඩපවත්වා  වගාවෙ දියුණුවට කටයුතු කරන්නෙ නම් නැවත පොල් අපනයනය බෝගයක් ලෙස විදේශ විනිමය ඉපයීමට යොදාගත හැකිය. මෙ සඳහා රජයේ බලධාරින් නිදි මරගාතේ කටයුතු කරන්නේ මන්ද ඔවුන්ගේ කැපවීම මෙයට අත්‍යවශ්‍ය නොවේද ?





✅ සමාදි ගමගේ

# කාන්තා දිනය සහ කාන්තාව



මාර්තු මාසය උදාවත්ම සියවසකට අධික කාලයක් පුරා සෑම වසරකම මාර්තු 8 වනදා ජාත්‍යන්තර වශයෙන් ජාත්‍යන්තර කාන්තා දින සැමරුම සිදුකරනු ලබයි. ගැහැණිය මෙලොව අපූර්වතම නිමැවුම් අතර ඉහළින් සිටී. දියණියක, යෙහෙළියක, සොහොයුරියක, බිරිඳක, මවක ලෙස විවිධ වයස් කාණ්ඩයන් වලදී ඇය විසින් ලබාදෙන්නා වූ සේවය මිළ කල නොහැකිය. එකී අමිල වූ ඇය අගයනු වස් පිදෙන උපහාරයක් ලෙස ජාත්‍යන්තර වශයෙන් කාන්තා දිනය සමරනු ලබයි.

කෙටියෙන් IWD ලෙස හැඳින්වෙන ජාත්‍යන්තර කාන්තා දිනය, එක්සත් ජාතීන්ගේ සංවිධානය (UN) විසින් පිළිගත් වාර්ෂික උත්සවයක් බවට පත්වීම දක්වා කම්කරු ව්‍යාපාරය හරහා වර්ධනය වූවකි.



ජාත්‍යන්තර කාන්තා දිනය වෙනුවෙන් ඇති වෙබ් අඩවියෙහි දැක්වෙන පරිදි, ජාත්‍යන්තර කාන්තා දිනයේ වර්ණ වන්නේ, දම්, කොළ සහ සුදු යන වර්ණ වේ. "දම්පාටින් යුක්ත සහ ගෞරවය සංකේතවත් වන අතර කොළ පාටින් සංකේතවත් වන්නේ, අපේක්ෂාවයි. මතභේදාත්මක සංකල්පයක් වුවත්, සුදු පැහැය පාරිශුද්ධත්වය නියෝජනය කරයි.එනම් හුදෙක් කාන්තාව නියෝජනය කරන්නාවූ වර්ණයන් ලෙස එකී වර්ණ ත්‍රිත්වය පිළිගැනේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ 2024 කාන්තා දින තේමාව වූයේ, "කාන්තාවන් වෙනුවෙන් ආයෝජනය කරන්න: ප්‍රගතිය වේගවත් කරන්න" යන්න ය. මෙම තේමාව ස්ත්‍රී පුරුෂ සමානාත්මතා ක්‍රියාමාර්ග සඳහා ආයෝජනය කිරීමේ හිඟයක් ඉස්මතු කිරීම අරමුණු කරගෙන යොදා තිබේ.එසේ අරමුණු කරගනිමින් මෙවර 112 වැනි කාන්තා දින සැමරුම සිදුකරනු ලැබීය.

මෙම කාන්තා දින සැමරීමේ ප්‍රධාන අරමුණ බවට පත් වූයේ ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති ලෝකයක් වෙනුවෙන් ක්‍රියා කිරීමත් ගෝලීය වශයෙන් කාන්තාව මුහුණ දෙන අභියෝග වලට විසඳුම් ලබා ගැනීමත් වේ. සැබැවින්ම කාන්තා දිනයක අවශ්‍යතාව කෙබඳුද? මෙය බොහෝ දෙනෙකු තුළ මතුවන සම්ප්‍රදායික පැනයකි. ඕනෑම දෙයකට නිශ්චිත දිනයක් වෙන් කිරීම අවශ්‍යද? පෙම්වතුන් වෙනුවෙන් පෙම්වතුන්ගේ දිනයකුත්, කම්කරුවන් වෙනුවෙන් කම්කරු දිනයකුත් ලෙසින් එක් දිනක් වෙන් කිරීම ප්‍රමාණවත්ද ? මෙය ලෝකයේ බොහෝ ජාත්‍යන්තර දිනයන්හි සුලබව නැගෙන පැනයකි. සැබැවින්ම මෙකී ඕනෑම ජාත්‍යන්තර දිනයක් වෙන්වන්නේ එම අදාළ ක්ෂේත්‍රයන්ගේ ලෝක මට්ටමින් ලබා ඇති ජයග්‍රහණ සිහි කිරීමටය. එබැවින් ඒවා සැමරුම් දිනයන් වේ. එමගින් එම දිනයන්ගේ පමණක් අදාළ දෑ සුරැකීම හෝ ඒ වෙනුවෙන් යම් යම් දෑ කතිකාවට ගොඩනැඟිය යුතුය යන හුදු මතයට අප ලඝු නොවිය යුතුය.

කාන්තාව නිතැතින්ම සම්ප්‍රදායික රාමුව තුළ සිරවී නොසිට විධිමත් අධ්‍යාපනයක් ලබා ගැනීම, ශක්තිමත් වෘත්තීය ජීවිතයක් ළඟාකරගැනීම, ස්වාධීන ආදායම් මාර්ගයක් ලබා ගැනීම යනාදී කරුණු සාක්ෂාත් කර ගැනීමට සමත් විය යුතුය.එමෙන්ම සමබරතාවකින් යුක්ත විය යුතුය. වයසත් සමඟ තමන්ට තමන්ව මඟ හැරීමට නොදී සම්පූර්ණ වූත් ප්‍රීතිමත්වූත් දිවියක් ගත කිරීමට තරම් දක්ෂ විය යුතුය. බුද්ධිමත් විය යුතුය. වර්තමාන සමාජ රටාව අනුව කාන්තාව තුළින් එතරම් ශක්තිමත් අනුවර්තනයක් බලාපොරොත්තු වීමට අපට සිදුව තිබේ. නමුත් සැබවින්ම කාන්තාවන්ගේ අයිතිවාසිකම්, කාන්තා නිදහස, කාන්තා හිංසනය යන කරුණු පිළිබඳව නිසි අවධානයට යොමු කර ඇත්දැයි තවමත් විසඳුම් නොමැති ගැටළුවකි.

වසරකට එක් වරක් කාන්තා දිනයේදී පමණක් කාන්තාව පිළිබඳව හෝ ඇගේ අයිතිවාසිකම් පිළිබඳව අවධානයට යොමු නොකොට සෑම විටම වයස් භේදයකින් හෝ තරාතිරමේ භේදයකින් තොරව කාන්තාවට ලැබිය යුතු ගෞරවය ලබා දීම වගේම නිසි තැන ලබාදීමට කටයුතු කළ යුතුය. මන්ද කාන්තාවක් වීම පහසු කාර්යයක් නොවන බව අප අවබෝධ කරගත යුතුය.

✅ ප්‍රබුද්ධිකා හේරත්


## මෙවර කලාපයේ කතුවරුන්

✅ යශෝධා චන්දලී රාමනායක
✅ පී.පෙරේරා
✅ මහේෂි දිසානායක
✅ පන්චලී භාග්‍යා
✅ එච්.ඩබ්ලිව්.එම්.පවිත්‍රානි
✅ සමාදි ගමගේ
✅ ටානියා එදිරිසිංහ
✅ අයි.ගිත්මි හර්ෂමාලි
✅ කව්මිණී බොරලැස්ස
✅ හිමාෂා රණතුංග
✅ ප්‍රබුද්ධිකා හේරත්
✅ අරුණි නානයක්කාර

## අධීක්ෂණය

ප්‍රධාන කතෘ -
■ **ප්‍රියශාන් මධුසංක**
ප්‍රධාන සංස්කාරක -
■ **තුෂාන් බණ්ඩාර**
සහය සංස්කාරක -
■ **හිමාෂා රණතුංග**

**Digital** ලෝකයේ **Modern** කියවන්නිය